# 16. ගස් වලින් සිදු වන අනතුරුදායක තත්ත්වය ඉවත් කිරීම - ගැලීම් සටහන

| | |
|---|---|
| (කොළ) | ඩිජිටල්කරණ දත්ත භාවිත කිරීම |
| (කහ) | ඉලෙක්ට්‍රොනික පණිවුඩ / ගනුදෙනු (SMS / WhatsApp / e-mail) |

සභාවේ වෙබ් අඩවිය මගින් හෝ පෙරටු කාර්යාලයට පැමිණ ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රය භාර ගෙන පසු විපරම් අංකය සහ ස්ථානීය පරීක්ෂණයට පැමිණෙන දිනය ඉල්ලුම්කරුට දැන්වීම

වගකීම: පෙරටු කාර්යාල නිලධාරි

↓

ඉල්ලුම් පත්‍රය විෂය භාර නිලධාරි මගින් තාක්ෂණ නිලධාරි වෙත යොමු කිරීම

වගකීම: පෙරටු කාර්යාල නිලධාරි

↓

ස්ථානීය පරීක්ෂණයට පැමිණෙන දිනය ඉල්ලුම්කරුට තහවුරු කිරීම

වගකීම: තාක්ෂණ නිලධාරි

↓

ස්ථානීය පරීක්ෂාව කර නිරීක්ෂණ හා නිර්දේශ වාර්තාව ඉංජිනේරුවරයාට / ලේකම්ට යොමු කිරීම

වගකීම: තාක්ෂණ නිලධාරි

↓

තාක්ෂණ නිලධාරීගේ නිර්දේශය තහවුරු කර නියමය ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය නගරාධිපතිට / සභාපතිට යොමු කිරීම

වගකීම: ඉංජිනේරු / ලේකම්

↓

ඉල්ලීම සම්බන්ධයෙන් වන නියමය ලබා දීම


වගකීම: නගරාධිපති / සභාපති

↓

ඉල්ලීමට ඉඩ දී තිබේ ද?

- ඔව් → අනතුරුදායක තත්ත්වය ඉවත් කිරීමේ නියමය ගස අයිතිකරුට දැන්වීම
  වගකීම: ඉංජිනේරු / ලේකම්
- නැත → හේතු දක්වමින් ඉල්ලීම ප්‍රතික්ෂේප කළ බව ඉල්ලුම්කරුට දැන්වීම
  වගකීම: ඉංජිනේරු / ලේකම්

ඊළඟ පිටුවට


පෙර පිටුවෙන්
අනතුරුදායක තත්ත්වය ඉවත් කිරීමේ නියමය ගස අයිතිකරුට දැන්වීම
වගකීම: ඉංජිනේරු / ලේකම්
අනතුරුදායක තත්ත්වය ඉවත් කළේ ද?
ඔව්
කාර්ය නිමාව
කාර්යසාධක දර්ශකය
නැත
සභාවේ වියදමින් අනතුරුදායක තත්ත්වය ඉවත් කර වියදම සභාවට ගෙවන ලෙස ගස අයිතිකරුට නියම කිරීම
වගකීම: ඉංජිනේරු / ලේකම්
වියදම ගෙවන ලද්දේ ද?
ඔව්
නැත
අය විය යුතු මුදල ණය මුදලක් සේ සලකා අය කර දෙන ලෙස මහේස්ත්‍රාත්ට ඉල්ලීමක් ගොනු කිරීම
වගකීම: ඉංජිනේරු / ලේකම්
අය විය යුතු මුදල අය කර ගැනීමට නියෝගය නිකුත් කිරීම
වගකීම: මහේස්ත්‍රාත්
කාර්යසාධක දර්ශකය
අය කර ගත් මුදල අදාළ වැය ශීර්ෂයට බැර කිරීම
වගකීම: විෂය භාර නිලධාරි

## 16. ගස් වලින් සිදු වන අනතුරුදායක තත්ත්වය ඉවත් කිරීම

### 01. හැඳින්වීම

(අ) පළාත් පාලන ආයතන වෙත පැවරී තිබෙන කර්තව්‍යය අතර, ජනතාවගේ සුබ විහරණය, පහසුව, සුබ සාධනය හා සියලු පහසුකම් ආරක්ෂා කිරීම යන කරුණු ප්‍රධාන වේ. මේ කාරණා අතරට මහජන පීඩා වැළැක්වීම ද ඇතුළත් වේ. යම් ගසකින් හෝ ඉන් කිසියම් කොටසකින් ගස අයිතිකරු නොවන බාහිර තැනැත්තෙකුට අනතුරුදායක තත්ත්වයක් ඇති විය හැකි අවස්ථාවක දී එම පීඩාව ඉවත් කරවීම සඳහා පළාත් පාලන ආයතනයේ විධායක ප්‍රධානියා වෙත මූලික නීතියෙන් බලය පවරා දී ඇත.

(ආ) මෙවැනි පැමිණිල්ලක් ලැබී ඇති විට අදාළ ගසෙන් හෝ එහි කිසියම් කොටසකින් යම් තැනැත්තකුගේ දේපළකට හෝ ජීවිතයට තර්ජනයක් වන්නේ ද යන්න විචක්ෂණශීලී ව පරීක්ෂා කර බැලීම අත්‍යාවශ්‍ය කාරණයක් වන අතර එවැනි අවස්ථාවක දී පමණක් පළාත් පාලන ආයතනයේ විධායක ප්‍රධානියා වෙත පවරා දී ඇති බලය ක්‍රියාත්මක කිරීමට වග බලා ගැනීම වැදගත් වේ.

(ඇ) ඇතැම් තැනැත්තන් අතර (ඉඩම් හිමිකරුවන් / හවුල් අයිතිකරුවන් / පවුල් අතර) පවතින පෞද්ගලික ආරවුල් සම්බන්ධ කර ගනිමින් මෙවැනි ඉල්ලීම් පළාත් පාලන ආයතනය වෙත ඉදිරිපත් කරනු ලබන අවස්ථා සහ ඉඩම් අයිතිය පිළිබඳ හබ කිරීම් සම්බන්ධයෙන් අධිකරණ කටයුතු ආරම්භ කර තිබෙන අවස්ථා පැවතිය හැකි බැවින් ඒ පිළිබඳ ව ද සැලකිලිමත් වීම වැදගත් වේ.

(ඈ) පැමිණිල්ලට අදාළ ව පීඩාවක් ඇති වීමට ඉඩ ඇත්තේ සම්පූර්ණ ගසෙන් ද නැතහොත් එහි කිසියම් කොටසකින් ද යන්න හෝ ගෙඩියකින් හෝ ගෙඩිවලින් ද යන්න නිවැරදිව හඳුනා ගැනීම අනිවාර්යයෙන් ම කළ යුතු ව ඇත.

(ඉ) යම් අවස්ථාවක තැනැත්තෙකුගේ දේපළකට හෝ ජීවිතයට හානි සිදු විය හැකි යම් ගසක් සම්පූර්ණයෙන්ම කපා ඉවත් කළ යුතු බවට හෝ ඉන් කොටසක් කපා ඉවත් කිරීමට ප්‍රමාණවත් කරුණු අනාවරණය වී ඇති අවස්ථාවක, ඒ ගස කපා ඉවත් කිරීමට නියෝගයක් නිකුත් කිරීමට පෙර, ඒ ගස 1956 අංක 9 දරන ගස් කපා හෙළීම පාලනය කිරීමේ පනත යටතේ සාදන ලද නියෝග වලින් කපා හෙළීම තහනම් කර ඇති ගසක් ද නැති ද යන්න තහවුරු කර ගැනීම ද නීතිමය අවශ්‍යතාවකි.

(ඊ) කිසියම් ගසකින් හෝ ඉන් කොටසකින් අනතුරුදායක තත්ත්වය ඇත්තේ ගස අයිතිකරුට හෝ හවුල් අයිතිය ඇති ඉඩමක යම් හවුල් අයිතිකරුවකුට නම්, ඒ අනතුරුදායක තත්ත්වය ඉවත් කර ගැනීම කළ යුත්තේ ගස අයිතිකරු හෝ හවුල් අයිතිකරුවන් විසින් ය.

### 02. නෛතික අධිකාරිය

(අ) මූලික නීති:

i. 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 136ආ වගන්තිය;

ii. 255 වන අධිකාරය වූ නගර සභා ආඥාපනතේ 127ඉ වගන්තිය;

iii. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 107 වන වගන්තිය.

(ආ) වෙනත් නීති

i. 1956 අංක 9 දරන ගස් කපා හෙළීම පාලනය කිරීමේ පනත;

ii. 1956 අංක 9 දරන ගස් කපා හෙළීම පාලනය කිරීමේ පනත යටතේ සාදන ලද නියෝග.

### 03 සුදුසුකම්

පහත සඳහන් කරුණු සම්පූර්ණ වී ඇති අවස්ථාවක, ඒ තැනැත්තා මේ සහනය ලබා ගැනීමට සුදුසුකම් ලබයි.

(අ) අනතුරුදායක තත්ත්වය පවතින ගස තමාට අයත් ඉඩමක පිහිටා නැති ගසක් විය යුතු ය.

(ආ) ගස අයත් වන තැනැත්තා නොවන වෙනත් යම් තැනැත්තෙකුට, ඒ යම් ගසක අත්තකින්, කඳකින්, ගෙඩියකින් හෝ සම්පූර්ණ ගසෙන් අනතුරුදායක තත්ත්වයක් හෙවත් පීඩාවක් වීමට ඉඩකඩ ඇතිවීමේ තත්ත්වයක් තහවුරු කළ හැකි විය යුතු ය.

සටහන: ගස පවතින ඉඩමේ අයිතිය, ඉල්ලීම කරන තැනැත්තා ද ඇතුළුව වෙනත් තැනැත්තන්ට ද හවුලේ පවතින ඉඩමක් වන විට හෝ ඒ ගස පවතින ඉඩමේ අයිතිය පිළිබඳ අධිකරණ ක්‍රියා මාර්ග ගනිමින් පවතින අවස්ථාවක හෝ ඉඩමේ අයිතිය පිළිබඳ ආරවුලක් පවතින අවස්ථාවක, ඒ ගසෙන් සිදු විය හැකි අනතුරුදායක තත්ත්වය සම්බන්ධ ඉල්ලීමක් පළාත් පාලන ආයතනයේ විධායක ප්‍රධානියා විසින් ක්‍රියා කිරීමට භාර ගැනීම නොකරනු ඇත. අධිකරණයේ ඉඩම් අයිතිය සම්බන්ධ නඩුවක් විභාග වන අවස්ථාවක, මෙම තත්ත්වය මෝසමක් අධිකරණයට කරුණු වාර්තා කර සහන ලබා ගැනීමට ක්‍රියා කරන ලෙස පැමිණිලිකරු දැනුම්වත් කළ යුතු ය.

## 04. ගාස්තු

මෙම කාර්යය පළාත් පාලන ආයතනවලට පවරා දෙනු ලැබ ඇත්තේ, මහජන සෞඛ්‍ය පිළිබඳ බලතල හා කාර්යය යටතේ පීඩා වැළැක්වීමට අදාළ වන පරිදි වේ. සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ කාර්යය පළාත් පාලන ආයතන වෙත පැවරී ඇති වගකීමක් වන බැවින් මේ සඳහා ගාස්තු අය කළ කිරීමට හැකියාවක් නැත.

## 05 ඉදිරිපත් කළ යුතු ලේඛන

මෙහි ඇමුණුමට අනුකූලව සකස් කළ ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු ය.

## 06. කාර්ය පටිපාටිය

| පටිපාටිය | කාල සීමාව | වගකීම |
|---|---|---|
| සභාවේ වෙබ් අඩවිය මගින් හෝ පෙරටු කාර්යාලයට පැමිණ ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රය භාර ගෙන පසු විපරම් අංකය සහ ස්ථානීය පරීක්ෂණයට පැමිණෙන දිනය ඉල්ලුම්කරුට දැන්වීම | | පෙරටු කාර්යාල නිලධාරි |
| ඉල්ලුම් පත්‍රය විෂය භාර නිලධාරි මගින් තාක්ෂණ නිලධාරිට යොමු කිරීම | ඉල්ලුම් පත්‍රය ලැබුණු දින | පෙරටු කාර්යාල නිලධාරි |
| ස්ථානීය පරීක්ෂණයට පැමිණෙන දිනය ඉල්ලුම්කරුට තහවුරු කිරීම | ඉල්ලුම් පත්‍රය තමන් වෙත ලැබුණු දින ම | තාක්ෂණ නිලධාරි |
| ස්ථානීය පරීක්ෂාව කර, නිරීක්ෂණ හා නිර්දේශ වාර්තාව ඉංජිනේරු / ලේකම් වෙත යොමු කිරීම | ස්ථානීය පරීක්ෂණය කළ දින | තාක්ෂණ නිලධාරි |
| තාක්ෂණ නිලධාරීගේ නිර්දේශ තහවුරු කරමින් අදාළ නියමය ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය නගරාධිපති / සභාපති වෙත යොමු කිරීම | තාක්ෂණ නිලධාරීගේ නිර්දේශය ලැබුණු වහාම | ඉංජිනේරු / ලේකම් |
| ඉල්ලීම සම්බන්ධ නියමය ලබා දීම | නිර්දේශය ලැබුණු වහාම | නගරාධිපති / සභාපති |
| අනතුරුදායක තත්ත්වය ඉවත් කිරීමේ නියමය ගස අයිතිකරුට දැන්වීම (කපා හෙළීම තහනම් ගසක් වන විට ප්‍රාදේශීය ලේකම්ට පිටපතක් සහිත ව) | නගරාධිපතිගේ / සභාපතිගේ නියමය ලද වහාම | ඉංජිනේරු / ලේකම් |

සටහන: 1. මෙම නියමය කිරීමට නගරාධිපතිට / සභාපතිට පැවරී ඇති බලය ඉංජිනේරුවරයාට / ලේකම්ට පවරා දෙනු ලැබීමෙන් මෙම කාර්යයේ දී ඇති වන ප්‍රමාදය වළක්වා ගත හැකි ය.

2. ගස සම්පූර්ණයෙන් ම කපා ඉවත් කරන ලෙස නගරාධිපති / සභාපති නියම කර ඇත්නම් සහ අදාළ ගස, කපා හෙළීම තහනම් කරන ලද වර්ගයේ ගසක් වන විට, නගරාධිපතිගේ / සභාපතිගේ නියමය දැක්වෙන ලිපියේ පිටපතක් දැන ගැනීම සඳහා අදාළ කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් වෙත ද යොමු කළ යුතු ය.

**07. නියමය අනුව ක්‍රියා කිරීම පැහැර හැර ඇති විට කාර්යය පටිපාටිය**

| පටිපාටිය | කාල සීමාව | වගකීම |
|---|---|---|
| නියමය අනුව ක්‍රියා කර නැති බව ඉල්ලුම්කරු විසින් වාර්තා කිරීම | | ඉල්ලුම්කරු |
| සභාවේ වියදමෙන් අදාළ නියමය ක්‍රියාත්මක කරවීම සහ ඒ සඳහා දරන ලද වියදම සභාවට ගෙවන ලෙස ගස අයිතිකරුට නියම කිරීම | ඉල්ලුම්කරුගේ වාර්තාව ලද වහාම | ඉංජිනේරු / ලේකම් |
| ගස අයිතිකරු අදාළ වියදම පියවීම පැහැර හරින්නේ නම්, එය අය කර දෙන ලෙසට වූ ඉල්ලීමක් මහේස්ත්‍රාත් වෙත ගොනු කිරීම | ගෙවීමට නියම කළ දිනය අවසන් වූ වහාම | ඉංජිනේරු / ලේකම් |
| ගස අයිතිකරුගෙන් අය විය යුතු මුදල දඩයක් වශයෙන් අය කිරීමට නියම කිරීම | නඩු දිනයේ දී | මහේස්ත්‍රාත් |

**08. ඇමුණුම්** ඇමුණුම

. . . . . . . . . . .සභාව

**<u>අනතුරුදායක ගස / ගස් ඉවත් කරවා ගැනීමට කෙරෙන ඉල්ලීම</u>**

1. ඉල්ලුම්කරුගේ නම (මුලකුරු සමග) : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
2. හැඳුනුම්පත් අංකය (තිබේ නම්) :. . . . . . . . . . . . . . . . . . . . .
3. ජංගම දුරකථන අංකය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
4. විද්‍යුත් තැපැල් ලිපිනය (ඇත්නම්) : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
5. තැපැල් ලිපිනය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
6. අනතුරුදායක බව පවතින ස්ථානයේ ලිපිනය: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

   . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

   (මේ ස්ථානයට ළඟා විය හැකි ආකාරය මේ ආකෘතියෙහි අවසාන පිටුවේ පැහැදිලිව සටහන් කරන්න)
7. අනතුරුදායක ගස පිහිටි දේපළෙහි අයිතිකරුගේ නම (දන්නේ නම්): . . . . . . . . . . . . . . . . . . . . . . . . .
8. අනතුරුදායක තත්ත්වය ඇති ගස පිළිබඳ තොරතුරු:

   (අ) ගසෙහි වර්ගය (දන්නේ නම්): . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

   (ආ) අනතුරුදායක තත්ත්වය -

   i. පවතින කොටස: අත්තකින් / අතු කිහිපයකින් / කඳෙන් / ගෙඩිවලින් /සම්පූර්ණ ගසෙන් *

   ii. ඇති වන්නේ: මායිම් තාප්පයට / නිවසේ කොටසකට / නිවැසියන්ට/ මාර්ගයේ යන අයට *
9. අනතුරුදායක ගස පවතින ඉඩම සම්බන්ධයෙන් ඔබ පාර්ශවකරුවකු වශයෙන් ඉඩම් ආරවුලක් හෝ ඉඩම සම්බන්ධ නඩුවක් පවතින්නේ ද නැති ද යන වග: ඔව් / නැත / නොදනී
10. ඉඩම සම්බන්ධ නඩුවක් පවතින්නේ නම්, අධිකරණය සහ නඩු අංකය (දන්නේ නම්): . . . . . . . . . . . . . .
11. ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරන අතර, ගසෙන් ඇතිවිය හැකි අනතුරුදායක තත්ත්වය ඉවත් කර දෙන ලෙස කරුණාවෙන් ඉල්ලමි.

දිනය: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

ඉල්ලුම්කරුගේ අත්සන

**කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා**

තාක්ෂණ නිලධාරි,

විෂය භාර නිලධාරි මගින්,

පසු පිටෙහි ඇති ඉල්ලීම පිළිබඳ කරුණු පරීක්ෂා කර ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ ලබා දෙන්න.

දිනය: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

නාගරික ඉංජිනේරු / ලේකම්

- - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - -

නගරාධිපති / සභාපති.

නාගරික ඉංජිනේරු / ලේකම් මගින්,

පසු පිටෙහි ඇති ඉල්ලීම අනුව මාගේ නිරීක්ෂණ හා නිර්දේශ පහත පරිදි වේ.

(අ) * ඉල්ලීමට අදාළ ගස තමන්ගේ ම ඉඩමෙහි පවතින ගසක් වන බැවින් සභාවට ඒ සම්බන්ධයෙන් මැදිහත් විය නොහැක.

* අදාළ ගස පවතින ඉඩම සම්බන්ධයෙන් ඉල්ලුම්කරු පාර්ශවයක් වන ඉඩම් ආරවුලක් පවතී. / ගස පිහිටි ඉඩමට . . . . . . . . . . . . . . . . . දිසා / මහේස්ත්‍රාත් අධිකරණයේ අංක . . . . . . . . . . . . . . යටතේ නඩුවක් පවතී.

(ආ) අනතුරුදායක ගස සම්බන්ධයෙන් පළාත් පාලන ආයතනයට මැදිහත් විය නොහැකි කාරණා නොමැති බැවින්, ඒ ගසෙන් සිදු විය හැකි අනතුරුදායක තත්ත්වය පිළිබඳ මාගේ නිරීක්ෂණ හා නිර්දේශ පහත සඳහන් කර ඇත.

(ඇ) අනතුරුදායක ගස පිළිබඳ ස්ථාන පරීක්ෂණය කළා. ඉල්ලුම්කරු විසින් අනතුරුදායක බවට ප්‍රකාශ කරන ගස සහ ඒ අවට අනතුරුදායක තත්ත්වයක් පවතින්නේ ද යන්න නිගමනය කළ හැකි වනු පිණිස ඒ ගස සහ අවට පිහිටි දේපළ හා / හෝ පාරවල් පිළිබඳ සිරස් සහ තිරස් දළ රූප සටහන් (sketch) මෙහි පහළින් දක්වා ඇත.

පරීක්ෂණ නිලධාරියාට උපදෙස්: ගස පිහිටි ස්ථානයේ සිට පීඩාව ඇතිවිය හැකි ස්ථානයට ඇති දුර, ගස කිසියම් කෝණයකින් ඇලව පවතින්නේ නම්, ඇලවී තිබෙන කෝණයේ අගය ($x^0$) හා ගසෙහි උස ($h = \tan x^0$) සඳහන් කරන්න.

| පරීක්ෂණ අවස්ථාවේ සුළං හැමූ දිශාව (ඊතල සටහනකින්) | **ගස සහ ඒ අවට සිරස් පැති කඩෙහි දළ රූප සටහන**<br>පරීක්ෂා කළ දිනය: . . . . . . . . . . . . . .<br>වේලාව: පෙ. ව. / ප. ව. . . . . . . . . . . . . . . | උතුරු රේඛාව (ඊතල සටහනකින්) |
|---|---|---|

ගස කිසියම් කෝණයකින් ඇලවී ඇත්නම් එම කෝණයේ අගය ($x^0$) = . . . . . . $^0$ ගසෙහි උස - $x^0$

ගස මුල සිට අවදානම විහිදෙන දුර ($h = \tan x^0$) = මීටර් . . . . (A)

(ගස මුල සිට අවදානම ඇතැයි දක්වන ස්ථානයට භෞතික දුර + . . . . . (B)

A > B = අනතුරුදායකයි

B > A = අනතුරුදායක නැත

තාක්ෂණ නිලධරයාගේ අත්සන: . . . . . . . . . . . . . . . .

| පරීක්ෂණ අවස්ථාවේ සුළං හැමූ දිශාව (ඊතල සටහනකින්) | **ගස සහ ඒ අවට තිරස් පැති කඩෙහි දළ රූප සටහන** | උතුරු රේඛාව (ඊතල සටහනකින්) |
|---|---|---|
| | | |

ගස කිසියම් කෝණයකින් ඇලවී ඇත්නම් එම කෝණයේ අගය ($x^0$) = . . . . . . $^0$

ගසෙහි උස (h = tan Ø) = මීටර් . . . . . . . . . .

තාක්ෂණ නිලධරයාගේ අත්සන: . . . . . . . . . . . . . . . .

(ඇ) ඉහත දත්ත අනුව මාගේ නිරීක්ෂණ පහත දැක්වේ: (අනවශ්‍ය කොටස් වේ නම්, ඒවා කපා හරින්න)

# මේ ගස . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . ගසකි.

# මෙම ගස 1956 අංක 9 දරන ගස් කපා හෙළීම පාලනය කිරීමේ පනත යටතේ සාදන ලද නියෝගවලට අනුව කපා හෙළීම තහනම් කළ ගස් වර්ගයකට අයත් වේ. / අයත් නොවේ.

# මේ ගසෙන් හෝ ගසෙහි කිසියම් කොටසකින් කිසියම් දේපළකට හෝ කිසියම් තැනැත්තෙකුට අනතුරුදායක තත්වයක් නැත. ඒ බව ඉල්ලුම්කරුට දැන්වීම සුදුසු බව නිර්දේශ කරමි.

# මේ ගසෙන් පහත දැක්වෙන ආකාරයෙන් අනතුරුදායක තත්ත්වයක් පවතී;

* ගසෙහි (ඉහත රූප සටහනේ රතු පාටින් ලකුණු කළ) . . . . . . . . . . . . . . . . දිසාවට විහිදී ඇති අත්තෙන් / අතුවලින්,

* ගසෙහි (ඉහත රූප සටහනේ රතු පාටින් ලකුණු කළ) . . . . . . . . . . . . . . . . . . . . දිසාවට විහිදී ඇති කඳෙන් / කඳන්වලින්,

* ගසේ (ඉහත රූප සටහනේ රතු පාටින් ලකුණු කළ) . . . . . . . . . .. දිසාවේ හට ගන්නා / මුළු ගසෙහි ම හට ගන්නා ගෙඩිවලින්,

* ගස ඇලවී පැවතීම නිසා ගස කඩා වැටීමෙන් / ගසේ ගෙඩි හා /හෝ අතු වැටීමෙන්,

# මේ අනතුරුදායක තත්ත්වය ඉවත් කිරීමට පහත සඳහන් ආකාරයෙන් ක්‍රියා කිරීම සුදුසු බව නිර්දේශ කරමි.

* ගස (ඉහත රූප සටහනේ රතු පාටින් ලකුණු කළ) . . . . . . . . . . . . . . . . . . දිසාවට වනසේ ඊට ප්‍රමාණවත් ශක්තියකින් යුතු කම්බියකින් ඇද බැඳ තැබීම.

* ගසෙහි (ඉහත රූප සටහනේ රතු පාටින් ලකුණු කළ) . . . . . . . . . . දිසාවට විහිදී ඇති අත්ත / අතු කපා ඉවත් කිරීම.

* ගසෙහි (ඉහත රූප සටහනේ රතු පාටින් ලකුණු කළ) . . . . . . . . . දිසාවට විහිදී ඇති කඳ / කඳන් කපා ඉවත් කිරීම.

* ගස (ඉහත රූප සටහනේ රතු පාටින් ලකුණු කළ), සම්පූර්ණ ගස කපා ඉවත් කිරීම.

# මේ අනුව, මේ ගස සම්බන්ධයෙන් ඉහත නිර්දේශයේ සඳහන් ආකාරයෙන් ක්‍රියා කරන ලෙස මහා නගර සභා ආඥාපනතේ 136ආ වගන්තියෙහි (1) වන උප වගන්තියෙන් / නගර සභා ආඥාපනතේ 127ඉ වගන්තියෙහි (1) වන උප වගන්තියෙන් / ප්‍රාදේශීය සභා පනතේ 107 වන වගන්තියෙහි (1) වන උප වගන්තියෙන් * ලැබී ඇති බලතල යටතේ ගසෙහි හිමිකරු හෝ පදිංචිකරු වෙත නියම කිරීම සුදුසු බව නිර්දේශ කරමි.

# මේ අනතුරුදායක ගස, කපා හෙළීම තහනම් කර ඇති වර්ගයක ගසක් වන බැවින් ඒ නිවේදනයේ පිටපතක් . . . . . . . . . . . . . . . . . . . . . . කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ද යොමු කිරීම සුදුසු බව වැඩිදුරටත් නිර්දේශ කරමි.

දිනය: . . . . . . . . . . . . . . . . . . .                . . . . . . . . . . . . . . . . . . . . .

තාක්ෂණ නිලධාරි

නගරාධිපති / සභාපති

තාක්ෂණ නිලධාරීගේ නිර්දේශ තවදුරටත් නිර්දේශ කර අනුමතයට ඉදිරිපත් කරමි.

දිනය: . . . . . . . . . . . . . . . . . . . .                    . . . . . . . . . . . . . . . . . . . . .

නාගරික ඉංජිනේරු / ලේකම්

නාගරික ඉංජිනේරු / ලේකම්,

ඉහත ඔබගේ නිර්දේශය අනුමත කරමි. අදාළ නියමය අනතුරුදායක ගස හිමිකරු හෝ පදිංචිකරු වෙත යොමු කිරීමේ ලිපිය මාගේ අත්සනට ඉදිරිපත් කරන්න.

දිනය: . . . . . . . . . . . . . . . . . . . .                    . . . . . . . . . . . . . . . . . .

නගරාධිපති / සභාපති

---

විෂය භාර නිලධාරි,

ඉහත අනුමතය අනුව අනතුරුදායක ගස හිමිකරු වෙත යොමු කළ යුතු ලිපිය සකස් කර මා මගින් නගරාධිපතිගේ / සභාපතිගේ අත්සනට ඉදිරිපත් කරන්න.

දිනය: . . . . . . . . . . . . . . . . . . . .                    . . . . . . . . . . . . . . . . . . . . .

නාගරික ඉංජිනේරු / ලේකම්

---

නගරාධිපති /සභාපති,

නාගරික ඉංජිනේරු / ලේකම් මඟින්,

ඉහත නියෝගය පරිදි සකස් කළ ලිපිය අනුමතයට යටත් ව අත්සනට ඉදිරිපත් කරමි.

(වෙනත් : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .)

දිනය: . . . . . . . . . . . . . . . . . . . .                    . . . . . . . . . . . . . . . . . . . . .

විෂය භාර නිලධාරි

**අනතුරුදායක ගස් සම්බන්ධයෙන් සභාවට ලැබී ඇති බලතල, ගසක් කපා ඉවත් කිරීම සම්බන්ධයෙන් බලපවත්වන වෙනත් නීතිවල නියම සහ ඉල්ලුම්කරු විසින් දැන ගෙන සිටිය යුතු වෙනත් කරුණු සහ <u>ඉල්ලුම්කරුට උපදෙස්</u>**

1. අනතුරුදායක ගස් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට බලතල ලැබී ඇත්තේ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 107 වන වගන්තිය හෝ 252 අධිකාරිය වූ මහා නගර සභා ආඥාපනතේ 136ආ වගන්තිය හෝ 255 වන අධිකාරිය වූ නගර සභා ආඥා පනතේ 127ඉ වගන්තිය මඟින් අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ ඇති යම් ගසකින් හෝ ගසක යම් අත්තකින්, කඳකින්, ගෙඩියකින් හෝ වෙනත් කිසිවකින් යම් ගොඩනැගිල්ලකට අලාභ හානි සිදු වන හෝ අලාභ හානි සිදු වීමට ඉඩ ඇති හෝ ඒ ගොඩනැගිල්ලේ පදිංචිකරුවකුට හෝ යම් ප්‍රසිද්ධ මාර්ගයක ගමන් ගන්නා අයගේ ආරක්ෂාවට අනතුරුදායක තත්වයක පවතින අවස්ථාවක, ඒ ගස හෝ එහි යම් කොටසක් පිළිබඳ ව ගත යුතු වඩාත් ම සාර්ථක ක්‍රියාමාර්ග ගැනීම පළාත් පාලන ආයතනයේ කාර්යය වේ.

2. යම් අනතුරුදායක ගසක් කපා ඉවත් කරන ලෙස නියම කිරීමට පළාත් පාලන ආයතනවල මූලික නීතියෙන් බලය ලැබී තිබුණේ වුව ද, ඇතැම් වර්ගවලට අයත් ගස් කපා හෙළීමට පෙර, ඒ සඳහා ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් කලින් අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බවට තවත් නීතියකින් නියම කර ඇත. මේ යටතට අයත් වන්නේ කපා හෙළීම තහනම් කර ඇති ගස් වර්ග (කොස්, බුරුත ආදී - කපා හෙළීම තහනම් කර ඇති ගස් පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය ලේකම් විමසා දැන ගත හැකි ය) වේ. මේ වර්ගයේ ගසකින් අනතුරුදායක තත්වයක් පවතින බව පළාත් පාලන ආයතනය නිගමනය කිරීමෙන් පසුව ඒ පිළිබඳ ව අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා දැනුවත් කර ඔහුගේ අනුමැතිය ද ලබා ගත යුතු බව සලකන්න.

3. කෙසේ වුව ද, තමන්ගේ ම ඉඩම තුළ පවතින යම් ගසකින් තමන්ගේ නිවසට හෝ ඒ නිවසේ පදිංචිකරුවකුට අනතුරුදායක තත්වයක් පවතින අවස්ථාවක සභාව ඒ පිළිබඳ ව මැදිහත් නොවන බව කරුණාවෙන් සලකන්න.

4. එසේම යම් ගසකින් අනතුරුදායක තත්වයක් පවතින අවස්ථාවක, ඒ ගස පවතින ඉඩම නො බෙදූ ඉඩමක් වශයෙන් පවතින සහ ගසෙහි අයිතිය පිළිබඳ ගැටළුකාරී තත්ත්වයක් ඇත්තේ නම් හෝ ඉඩම සම්බන්ධයෙන් නඩුවක් හෝ ආරවුලක් පවතින්නේ නම් එවිට, ඒ ගසෙන් පවතින අනතුරුදායක තත්ත්වය පිළිබඳ පළාත් පාලන ආයතනයේ නිගමනය පමණක් නිකුත් කරනු ලබන අතර සිවිල් නඩු මාර්ගයෙන් හෝ සමථ මණ්ඩලය හෝ පොලිසියේ මැදිහත් වීමෙන් ඒ ගස සම්බන්ධ ඉදිරි කටයුතු කරන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනු ලැබේ.

5. කිසියම් ඉඩමක වැට මායිම් ප්‍රශ්නයක් උද්ගත වීම නිසා හෝ වෙනත් යම් පෞද්ගලික ආරවුලක ප්‍රතිඵලයක් වශයෙන් සාවද්‍ය ලෙස යම් ගසක අනතුරුදායක තත්වයක් පවතින්නේ යැයි කෙරෙන ඉල්ලීම් පළාත් පාලන ආයතනයට ඉදිරිපත් නොකරන ලෙස ද කරුණාවෙන් ඉල්ලා සිටිනු ලැබේ.

6. කිසියම් ගසකින් අනතුරුදායක තත්වයක් පවතින අවස්ථාවක පමණක් පළාත් පාලන ආයතනය විසින් ඒ බව දන්වමින් අනතුරුදායක තත්ත්වය ඉවත් කළ යුතු ආකාරය පිළිබඳ ව ඒ ගස හිමිකරු හෝ ගස පිහිටා ඇති ඉඩමේ පදිංචිකරු වෙත නිවේදනයක් නිකුත් කරනු ලැබේ. එසේම ඒ අනතුරුදායක ගස, ගස් කපා හෙළීම පාලනය කිරීමේ පනත සහ / හෝ වන සත්ත්ව හා වෘක්ෂලතා ආඥාපනත හෝ ඒ යම් නීතියක් යටතේ හෝ කපා හෙළීම තහනම් කර ඇති බව ප්‍රකාශයට පත් කරනු ලැබූ කිසියම් වර්ගයක ගසක් වන විට, ඒ නිවේදනයේ පිටපතක් අදාළ ප්‍රාදේශීය ලේකම්වරයාට ද නිකුත් කරනු ලැබේ. මේ නිවේදනයේ පිටපතක් ඉල්ලුම්කරු වෙත ද නිකුත් කරනු ලබන අතර, ඒ පිටපත කොට්ඨාශයේ ග්‍රාම නිලධරයා වෙත ඉදිරිපත් කර ප්‍රාදේශීය ලේකම්වරයා තවදුරටත් දැනුවත් කිරීමට ක්‍රියා කළ යුතු ය.